<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය</u>

**1. හැඳින්වීම**

රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවාවේ නිලධාරීන්ට මෙන්ම පළාත් රාජ්‍ය සේවයටද ඇති වන අපහසුතා මගහැරවීම පිණිස මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය සකස්කරනු ලැබේ.

**2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

**2.1 <u>අදාළ නිලධරයන්</u>**

පහත සඳහන් සේවාවන්හි නිලධරයන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරේ.

i. මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (III/II/I ශ්‍රේණි)
ii. මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණිය
iii. මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවය
iv. මධ්‍යම පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
v. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවය
vi. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවය

**2.2 <u>සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය</u>**

2.2.1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 03 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත්වේ.

<u>සටහන</u> - පහත සඳහන් ආයතනයන්හි උපරිම සේවා කාලය වසර 03 කි.

I. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
II. මධ්‍යම පළාත් සභා ලේකම් කාර්යාලය (මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ට පමණි)

2.2.3 ප්‍රියමනාප සේවා ස්ථාන වල වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත්වේ.

**2.3 <u>සේවා ස්ථාන වර්ගීකරණය</u>**

2.3.1 ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස සලකනු ලබන්නේ පහත සඳහන් ආයතන සහ ස්ථාන මාරුවීී යාමට ඉල්ලුම වැඩි ප්‍රමාණයක් ඇති සේවා ස්ථානයි.

i. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
ii. මධ්‍යම පළාත් සභා ලේකම් කාර්යාලය (මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ට පමණි)

2.3.2 ස්ථාන මාරුවී යාමට ඉල්ලුම අඩු ප්‍රමාණයක් ඇති සේවා ස්ථාන ප්‍රියමනාප නොවන සේවා ස්ථාන ලෙස හැඳින්වේ.

2.3.3 සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයැදුම්පත්‍ර ලැබීමෙන් පසු එක් එක් ආයතනය වෙත ස්ථානමාරුවීම් සඳහා ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව අනුව ප්‍රියමනාප සේවා ස්ථාන හා ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය මගින් වර්ගීකරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

2.3.4 පහත දැක්වෙන හේතු මත ස්ථාන මාරුවීම් සිදු කිරීම වාර්ෂික ස්ථාන මාරු යටතට නොගැනේ.

(අ). සේවා අවශ්‍යතාවය මත.
(ආ). අන්‍යොන්‍ය ස්ථාන මාරු මත.
(ඇ). පත්කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත.
(ඈ). සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරු කිරීම්.
(ඉ). විනය හේතු මත.

**2.4 <u>ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු</u>**

i. වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි 2.2.2 ඡේදය යටතට ගැනෙන සියළු නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

ii. වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවීමට ඉල්ලා ඇති විටෙක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා නිලධරයා ස්ථාන මාරුවීමට ඉල්ලා ඇති ආයතනයේ සේවය කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 ඡේදයේ සඳහන් පරිදි ස්ථාන මාරුවීම් වලට යටත් වන හා අදාළ ආයතනයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කරනු ලැබේ.

iii. යම් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයක වැඩිම සේවා කාලයක් සපුරා ඇති නිලධරයන් (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

iv. ප්‍රියමනාප සේවා ස්ථාන වලට ස්ථාන මාරුවීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කළ නිලධාරීන්ටය. මෙවැනි ස්ථානමාරු වලදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්වයන්ද සලකා බලනු ලැබේ.

v. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී දෙපාර්තමේන්තුවල සේවා අවශ්‍යතාවයන්ද කාර්යාලවල කාර්ය මණ්ඩල කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමටද හැම විටම උත්සාහ කළ යුතුවේ.

vi. ස්ථාන මාරුවීමට කාලය සපුරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් නිසි වැඩපිළිවෙලක් සකස් කර ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුය. (උදා- ස්ථාන මාරු ලැබීමට සිටින නිලධරයාගේ ආයතනයේ රාජකාරි කල්වේලා ඇතිව වෙනත් නිලධරයකුට පුහුණු කිරීම)

**2.4.1 සේවා කාලය ගණනය කිරීම**

i. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා- 2019 ස්ථාන මාරුවීම් සඳහා 2018.12.31 දිනය)

ii. සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත්, නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි. (තවද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ)

iii. කිසියම් ආයතනයක්/ දෙපාර්තමේන්තුවක්/ අමාත්‍යාංශයක් යටතේ කුමන උප කාර්යාලයක සේවය කළද එම සේවා කාලය එම ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ. (උදා. මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සේවය කිරීම)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

iv. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන ස්ථාපිත වීම හෝ අහෝසි වීම හේතුවෙන් එක් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක/ ආයතනයක සිට වෙනත් අමාත්‍යාංශයකට/ දෙපාර්තමේන්තුවකට/ ආයතනයකට අනුයුක්ත කිරීමට සිදු වූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේදී අහෝසි කරන ලද ආයතනයේ සේවා කාලයද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

**2.4.2 ප්‍රිය මනාප සේවා ස්ථානවල සේවා කාලය ගණනය කිරීම**

i. ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකුට නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලුම් කළ හැක්කේ ප්‍රියමනාප සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 15 ක් ගතවී ඇත්නම් පමණි.

ii. සේවාවන් එකකට වැඩි ගණනක සේවය කළ නිලධරයන්ගේ ප්‍රියමනාප සේවා ස්ථානයක සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයකදී එම සේවයට ප්‍රියමනාප වූ ආයතනයක සේවය කර ඇත්නම් එම සේවා කාලයද ගණන් ගනු ලැබේ. (උදා- කණිෂ්ඨ සේවක උසස්වීම් ලද නිලධරයන්ගේ කණිෂ්ඨ සේවක සේවා කාලය)

iii. ප්‍රියමනාප යැයි සැළකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිණියකගේ සේවා ස්ථානයක සේවා කාලය ගණනය කිරීමේදී එම කාලය තුළදී ලබා ගෙන ඇති ප්‍රසූත නිවාඩු යටතට ගැනෙන වැටුප් සහිත, අඩවැටුප් හා වැටුප් රහිත නිවාඩු කාලය ගණනය කරනු නොලැබේ.

iv. ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය කරන නිලධරයන් විසින් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථාන වලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කළ නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

**2.4.3 විශේෂිත කරුණු**

i. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතුවේ. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයකට මාරු කළ යුතුය.

ii. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව, තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලබා දියහැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර ප්‍රියමනාප නොවන්නාවූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන්ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

iii. ළදරුවන්, පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාළීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සළකා බලනු ලැබේ.

iv. ආබාධිත කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.

**2.4.4 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්**

i. අවුරුදු 55 ක් ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද, ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

ii. වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනට අවු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුවද ස්ථාන මාරු නොකළ යුතුය. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 59 ඉක්මවූ නිලධරයන්ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරු නොකළ යුතුය.

**2.4.5 වෘත්තිය සංගම් සඳහා අනුග්‍රහය**

I. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ **(මධ්‍යම පළාත තුළ ලියාපදිංචි හා අනුමත)** ඉහත සඳහන් සේවයකට අයත් නිලධාරීන්ගේ නියෝජනයන් සහිත, ඉහත සඳහන් සේවයකට අයත් වෘත්තිය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයින් මාරු කරන්නේනම් අදාළ වෘත්තිය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

II. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්තිවිදීමට අපේක්ෂා කරන ප්‍රස්තුත සේවයේ වෘත්තිය සංගම්වල නිලධාරීන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් පිළියෙල කර ( ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.2 උප වගන්තිය අනුව අනුග්‍රහ ලබා දිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයකටද යන වගත්, අනුයුක්ත කළ යුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. ප්‍රියමනාප ආයතනවල රැඳී සිටිමට මෙම අනුග්‍රහය අදාළ කර ගත නොහැක.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

3. <u>වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තරය</u>

වාර්ෂික ස්ථාන මාරු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඉහත 2.1 හි සඳහන් සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ. එම එක් එක් වාර්ෂික ස්ථාන මාරු කමිටුවල සංයුතිය පහත පරිදි වේ.

- ප්‍රධාන ලේකම් විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු
- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නම් කරනු ලබන ආයතන කටයුතු සම්බන්ධ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු
- මධ්‍යම පළාත් අමාත්‍යාංශයක ආයතන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු
- එක් එක් සේවාවන් වලට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙකු

## 4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තරය

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචනය කිරීම සඳහා එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ. එම එක් එක් සමාලෝචන කමිටුවල සංයුතිය පහත පරිදි වේ.

- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්
- වාර්ෂික ස්ථාන මාරු කමිටුවට අයත්වූ නිලධරයෙකු
- පළාත් සභාවේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයෙකු

සටහන - මෙම කමිටුවේ නිරීක්ෂකයින් වශයෙන් එක් එක් සේවාවන් වලට අයත් 15% ක අවම නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙකු සහභාගි කරවා ගනු ඇත.

## 5. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | |
|---|---|
| ජූලි 01 ට පෙර | දැන්වීම් සඳහා කාලසීමාව |
| ජූලි 31 ට පෙර | ස්ථාන මාරු පරිපාටිය සකස් කිරීම හා ස්ථාන මාරු කමිටු පිහිටුවීම |
| අගෝස්තු 20 ට පෙර | ස්ථාන මාරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය |
| සැප්තැම්බර් 30 ට පෙර | ස්ථාන මාරු තීරණ ගෙන අවසන් කොට ආයතන වලට දැනුම් දීම |
| ඔක්තොබර් 31 ට පෙර | අභියාචනා සලකා බැලීම |
| නොවැම්බර් 15 ට පෙර | ස්ථාන මාරු අභියාචනා පිළිබඳ අවසාන තීරණය දැනුම් දීම |
| ජනවාරි 01 දින සිට | ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම |

## 6. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම

වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් අතෘප්තිමත්වන නිලධරයන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා ඔක්තෝබර් 15 ට පෙර ඉදිරිපත් කළ යුතු වන අතර, අභියාචනයේ සඳහන් කරුණු තහවුරු කිරීමට අදාළ ලියකියවිලි වල සහතික කළ පිටපත්ද ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමග ඉදිරිපත් කළ යුතුය. ඔක්තෝබර් 15 දිනෙන් පසුව එවන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ..................................

02. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය (සාමාජික) ..................................

03. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ..................................

04. ඒ.එම්.එම්.ජේ. නිස්තාර් මහතා (සාමාජික) A. J. M. M. Nisthar

05. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..................................

දිනය:- 2018-08-14

ආණ්ඩුකාර ලේකම්,

2018-08-14 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 18/952 යටතේ

කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය:- 2018.08.16

..................................
ආර්.එම්.එන්. රත්නායක
ලේකම්
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය.

අනුමත කරමි / ~~නොකරමි~~

දිනය:-............................

..................................
පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2018/09/03